නීතිරීති සහ කොන්දේසි (සියලුම ව්‍යාපාරික /ආයතනික ගිණුම් පාලනය කෙරෙන)

පටුන

නීතිරීති ඉදිරිපත් කිරීම

අර්ථ නිරූපණ

1. ව්‍යාපාරික ගිණුම් විවෘත කිරීමේ යෝග්‍යතා උපමානයන්
2. තැන්පතු
3. චෙක්පොත්
4. මුදල් ආපසුගැනීම්
5. වාර ගිණුම් ප්‍රකාශන
6. පාරිභෝගික තොරතුරු එකතුකිරීම, සැකසුම හා හුවමාරු කරගැනීම
7. පාරිභෝගිකයාගේ බැඳීම්
8. දත්ත ආරක්ෂණය
9. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රියාකාරකම්
10. බදු අනුකූලතාව
11. පොදු
12. නීතිරීති සහ කොන්දේසි
13. අවසන් කිරීමෙන් පසු පැවැත්ම
14. පාලනයෙන් බැහැර සිදුවීම්
15. බුන්වත්වීම් පිළිබඳ නීතිමය කටයුතු
16. ක්‍රියාත්මක නොවන ගිණුම් - අක්‍රීය සහ අතහැර දැමූ දේපල

පහත දැක්වෙන නීතිරීති සහ කොන්දේසි මගින් කාගිල්ස් බැන්ක් ලිමිටඩ් (මින් මතුවට 'බැංකුව' සහ/හෝ 'කාගිල්ස් බැංකුව' යනුවෙන් හැඳින්වෙන) හි සියලුම ව්‍යාපාරික ගිණුම් පාලනය වනු ඇත.

කාගිල්ස් බැන්ක් ලිමිටඩ් යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින අවසරලත් වාණිජ බැංකුවකි.

කාගිල්ස් බැන්ක් ලිමිටඩ් (මින් මතුවට "කාගිල්ස් බැංකුව", "බැංකුව", "අප", "අපගේ", "අපේ", යනුවෙන් හැඳින්වෙන අතර, සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුමෙන් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද ඇතුළත්ව) බැංකුකරණ, ආයෝජන, මූල්‍ය හා වෙනත් ගනුදෙනු සහ විවිධාකාර ස්වභාවයේ ගනුදෙනු සිදුකිරීමේ කාර්යය සඳහා සහ, කාගිල්ස් බැංකුව වෙතින් සේවාවන්, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබාගැනීමට කාගිල්ස් බැංකුව වෙත උපදෙස් ලබාදීමට හා සන්නිවේදනය කිරීමට ගිණුම් හිමියා/හිමියන්ට (මින් මතුවට "ගිණුම් හිමියා/හිමියන්", "ඔබ", "ඔබගේ", "ඔබේ" යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එම යෙදුමෙන් සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට ගිණුම් හිමියා/හිමියන්, බලයලත් අත්සන්කරුවන්, සහ ඕනෑම නීත්‍යානුකූල නියෝජිතයකු ද අදහස් වන අතර, ඇතුළත් වේ) හැකිවනු පිණිස මෙම නීතිරීති හා කොන්දේසිවලට යටත්ව, කලින් කලට බැංකු සේවාවන්, පහසුකම් සහ තොරතුරු සපයනු ඇත.

මෙම නීතිරීති සහ කොන්දේසි (මින් මතුවට දක්වා ඇත) මගින්, ගිණුම් හිමියා/හිමියන් විසින් අප වෙතින් භාවිත කරනු ලබන හෝ ඉල්ලා සිටින, හෝ අප විසින් ගිණුම් හිමියා/හිමියන් වෙත සපයනු ලබන බැංකුකරණ සේවාවන්, පහසුකම් සහ තොරතුරු වලට අදාළව ගිණුම් හිමියාගේ/හිමියන්ගේ වගකීම් සහ බැඳීම් පැහැදිලි කෙරෙයි.

ඉහත කී "කාගිල්ස් බැංකුව" සහ "ගිණුම් හිමියා/හිමියන්" මෙහි මින් මතුවට ඇතැම් අවස්ථාවන් හි දී සාමූහිකව මෙම ගිවිසුමෙහි "පාර්ශ්වකරුවන්" (මින් මතුවට දක්වා ඇත) ලෙස ද තනි තනි වශයෙන් මෙම ගිවිසුමෙහි "පාර්ශ්වය" ලෙස ද හැඳින්වෙනු ඇත.

මෙහි අන්තර්ගත සියලුම නීතිරීති සහ කොන්දේසි මගින් ගිණුම් හිමියා/හිමියන් පරම ලෙස සහ සමව බැඳේ. එකී නීතිරීති සහ කොන්දේසි, බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cargillsbank.com වෙතින් හෝ ඉල්ලා සිටින විට, එය පිටපතක් වශයෙන් බැංකුවේ ඕනෑම ශාඛා කාර්යාලයක් වෙතින් හෝ ලබාගත හැකිය. මෙමගින්, ගිණුම් හිමියා/හිමියන්ට දැනුම්දීමක් ලබාදුන් ලෙසට සැලකෙනු ඇත.

නීතිරීති සහ කොන්දේසි පිළිගැනීම

මා /අප විසින් මෙම නීතිරීති හා කොන්දේසි කියවා ඇති බවත් සම්පූර්ණයෙන්ම තේරුම් ගෙන ඇති බවත් මම/අපි මෙමගින් පිළිගන්නා අතර, ඒ යටතේ පවතින බැඳීම්, වගකීම් සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන් මම/අපි දැනුවත්ව සිටින අතර, ඉහත කී නීතිරීති හා කොන්දේසි පිළිගනිමි/ගනිමු.

……………………………………………………..…   ………………………………………………..

නීතිරීති ඉදිරිපත් කිරීම

- ඒකවචන යෙදුම්වලට බහුවචන යෙදුම් (සහ ප්‍රතිලෝම වශයෙන්) ද ඇතුළත් වේ.
- පද භාවිතය 'ඔබ', 'ඔබගේ', 'ඔහුට', හෝ සමාන සර්ව නාමපද භාවිතය මගින් එසේ පිළිගනු ලබන අවස්ථාවල දී උචිත ලෙස ගිණුම් හිමියා අදහස් කරනු ලැබිය යුතු ය. පුරුෂ ලිංග වචන සඳහා වූ සියලු සඳහන් කිරීම් මගින් ස්ත්‍රී ලිංග වචන ද ඇතුළත් වන්නේ ය.
- මෙහි දක්වා ඇති නීතිරීති හා කොන්දේසි මගින් සියලුම පොදු අයදුම්පත් වලට අමතරව, කාගිල්ස් බැංකුවේ සියලුම ඉතුරුම්, ජංගම සහ වාර තැන්පතු ව්‍යාපාරික ගිණුම් පාලනය වේ.
- මෙමගින් ආවරණය නොවන විශේෂිත සැලසුම් සහ සේවාවන්ට අදාළ නීතිරීති හා කොන්දේසි ශාඛා වෙතින් ඉල්ලීමකින් ලබාගත හැක.

අර්ථනිරූපනඃ

මෙම නීතිරීති හා කොන්දේසිවල තද පැහැති අකුරෙන් දක්වා ඇති යෙදුම් සඳහා, සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අවශ්‍ය නොකෙරෙන්නේ නම්, පහත දැක්වෙන අර්ථ පවතිනු ඇතඃ

- **"ගිණුම/ගිණුම්"** යන්නෙන් අදහස් වන්නේ, ව්‍යාපාරික ගිණුමක් වන අතර, එය සමස්තයක් ලෙස ඉතුරුම්, ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම් වලට සීමා නොවේ.
- **"ගිණුම් හිමියා/හිමියන්"** යනුවෙන් අදහස් වන්නේ, වගකීමෙන් සීමිත සමාගම් හෝ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතන/සංවිධාන වේ.
- **"අයදුම්පත"** යනුවෙන් අදහස් වන්නේ, බැංකුව විසින් සපයනු ලබන බැංකු සැලසුමකට හෝ සේවාවකට අදාළව ගනුදෙනුකරු විසින් සම්පූර්ණ කරන ලද දෘඩ පිටපත් හෝ විද්‍යුත් අයදුම්පත් ආකෘතිපත්‍ර හෝ මැන්ඩේට පත්‍ර වේ.
- **"බලධාරීන්"** යන්නෙන් අදහස් වන්නේ, කාගිල්ස් බැංකුව මත අධිකරණ බලය පවතින යම් අධිකරණ, පරිපාලන හෝ නියාමන ආයතනයක්, යම් රාජ්‍ය හෝ පොදු හෝ රජයේ නියෝජිත ආයතනයක්, උපකාරී ආයතනයක් හෝ අධිකාරියක්, යම් බදු අධිකාරියක්, සුරැකුම් හෝ වස්තු හුවමාරු, අධිකරණ, මහ බැංකුව හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් හෝ එහි ඕනෑම නියෝජිතයෙකු වේ.
- **"බැංකුව"** යන්නෙන් අදහස් වන්නේ, කාගිල්ස් බැංකුව වේ.
- **"බැංකුකරණ දිනය"**/ **"සාමාන්‍ය බැංකුකරණ වේලාවන්"** සහ **"වැඩකරන දින/පැය"** යන්නෙන් අදහස් වන්නේ, අප විසින් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, බැංකුකරණ/වැඩකරන දින සහ සාමාන්‍ය බැංකුකරණ/වැඩකරන පැය වේ.
- **"කාගිල්ස් බැන්ක් ලිමිටඩ් /කාගිල්ස් බැංකුව/බැංකුව"** යන යෙදුම් මගින් අදහස් වන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ බලය යටතේ නිසි ලෙස සංස්ථාපනය කරන ලද, කොළඹ 03, ගාලු පාර, අංක 696 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි ලිපිනය පිහිටි, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතු සිදුකරන බැංකුව වේ.

- **"අනුකූලතා බැඳීම"** යන්නෙන් අදහස් වන්නේ, (a) අදාළ යම් දේශීය හෝ විදේශීය ව්‍යවස්ථාවක්, නීතියක්, රෙගුලාසියක්, ආඥා පනතක්, රීතියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, ස්වේච්ඡා නීති සංග්‍රහයක්, නියමයක්, සම්බාධක රෙජීමයක්, අධිකරණ තීන්දුවක්, ඇවිරුම් නියෝගයක්, කාගිල්ස් බැංකුවේ යම් සාමාජිකයෙකු හා යම් අධිකාරියක් අතර ඇති ගිවිසුමක්, හෝ කාගිස්ල් බැංකු සමූහයේ යම් සාමාජිකයෙකුට අදාළ වන බලධාරීන් අතර පවතින යම් ගිවිසුමක් හෝ සම්මුතියක් ("**නීති**"), හෝ ජාත්‍යන්තර මඟපෙන්වුමක් හා අභ්‍යන්තර ප්‍රතිපත්ති හෝ කාර්යපටිපාටි, (b) අධිකාරීන් වෙතින් ලැබෙන යම් (වලංගු) ඉල්ලීමක් හෝ වාර්තා කිරීමේ, නියාමන වෙළඳ වාර්තා කිරීමේ, හෙළිදරව් කිරීමේ හෝ නීති යටතේ පවතින වෙනත් යම් බැඳීමක්, සහ (c) අපගේ ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාව තහවුරු කරගැනීම සඳහා කාගිල්ස් බැංකුව වෙත අවශ්‍ය කෙරෙන නීතිවලට, අනුකූලව ක්‍රියා කිරීමට කාගිල්ස් බැංකුවේ යම් සාමාජිකයෙකුගේ බැඳීමකි.
- **"රහස්‍ය තොරතුරු"** යන්නෙන් අදහස් වන්නේ, ගනුදෙනුකරුවෙකු විසින් හෙළිදරව් කරන අවස්ථාවේ දී රහස්‍ය ලෙස නියම කරන ලද හෝ සාධාරණ පුද්ගලයෙකු විසින් රහස්‍ය, පොදු නොවන හෝ ස්වභාවයෙන් හිමිකාරිත්වයක් සහිත ලෙසට සලකනු ලබන හෝ ඕනෑම තොරතුරක් වේ.
- **"සම්බන්ධිත තැනැත්තෙකු"** යන්නෙන් අදහස් වන්නේ, ගනුදෙනුකරුවෙකු විසින් හෝ වෙනුවෙන් යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් කාගිල්ස් බැංකුවෙහි සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික දත්ත හෝ බදු තොරතුරු ඇතුලුව) සපයන්නේ ද, නැතහොත් සේවාවන්ගේ ප්‍රතිපාදන හා සම්බන්ධයෙන් වෙනත් යම් ආකාරයකින් කාගිල්ස් බැංකුවෙහි ඕනෑම සාමාජිකයෙකු වෙත තොරතුරු ලැබෙන්නේ ද, ඒ තැනැත්තා හෝ ආයතනය වේ. ගනුදෙනුකරුවා සම්බන්ධයෙන්, සම්බන්ධිත තැනැත්තා යන්නට යම් (ගනුදෙනුකරුවාගේ) ඇපකරුවෙකු, සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධාරියෙකු, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු හෝ සාමාජිකයෙකු, යම් "ප්‍රාමාණික හිමිකරුවෙකු", "පාලක පුද්ගලයෙකු" හෝ අර්ථලාභී හිමිකරුවෙකු, භාරයක යම් භාරකරුවෙකු, දායකයෙකු හෝ ආරක්ෂකයෙකු, යම් නියම කළ ගිණුමක ගිණුම් හිමියෙකු, යම් නියම කළ ගෙවීමක ගෙවීම් ලබන්නෙකු, ගනුදෙනුකරු නියෝජනය කරන්නෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු හෝ, කාගිල්ස් බැංකුව සමග පවතින සිය බැංකු සබඳතාවකට අදාළ වන ගනුදෙනුකරු හා සම්බන්ධයක් පවතින වෙනත් යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.
- **"පාලක පුද්ගලයන්"** යන්නෙන් පොදුවේ අදහස් වන්නේ, යම් ආයතනයක් මත පාලනය පවත්වාගෙන යන තනි පුද්ගලයන් (භාරයක් සම්බන්ධයෙන් නම්, මෙම තැනැත්තන් වන්නේ දායකයා, භාරකරුවන්, ආරක්ෂකයා, අර්ථලාභීන් හෝ අර්ථලාභී කාණ්ඩය සහ භාරය මත අවසාන සඵල පාලනය ක්‍රියාත්මක කරන වෙනත් යම් පුද්ගලයෙකු වන අතර, භාරයක් හැර වෙනත් යම් නෛතික ආයතනයක් සම්බන්ධයෙන් නම් මෙම රීතියෙන් අදහස් වන්නේ, ඊට සම හෝ සමාන තනතුරු වල පාලනය දරන පුද්ගලයන්) වේ.

- **"ගනුදෙනුකරුවන්"** යන්නෙන් අදහස් වන්නේ, වගකීමෙන් සීමිත සමාගම් හෝ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතන/සංවිධාන වේ.
- **"පාරිභෝගික තොරතුරු"** යන්නෙන් අදහස් වන්නේ, පුද්ගලික දත්ත, රහස්‍ය තොරතුරු සහ/හෝ ගනුදෙනුකරුගේ හෝ සම්බන්ධිත තැනැත්තෙකුගේ බදු තොරතුරු (ඊට අදාළ ප්‍රකාශන, අත්හැරීම් හා කැමැත්ත පළකිරීම් ද ඇතුළත්ව) වේ.
- **"මූල්‍ය අපරාධ"** යන්නෙන් අදහස් වන්නේ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, අල්ලස්, දූෂණ, බදු මගහැරීම්, වංචා, ආර්ථික හෝ වෙළඳ සම්බාධක මගහැරීම්, සහ/හෝ උල්ලංඝණය කිරීම්, හෝ මෙම කාරණාවලට අදාළව ඇති කිසියම් නීති හෝ රෙගුලාසි කඩකිරීම් හෝ මගහැරීමට උත්සාහ කිරීම් වේ.
- **"හානිය"** යන්නෙන් අදහස් වන්නේ, කවර ආකාරයකින් හෝ ගණනය කෙරෙන හෝ සිදුවන යම් අයැදීමක්, අයකිරීමක්, පිරිවැයක් (නීතිමය හෝ වෙනත් වෘත්තීමය ගාස්තු ද ඇතුළත් ව නමුත්, ඊට සීමා නොවී) එය සෘජු හෝ වක්‍ර, ආනුෂංගික, දණ්ඩනීය හෝ අවස්ථානුකූල වුවද, හානියක්, ණයක්, වියදමක්, බදු මුදලක්, වගකීමක්, බැඳීමක්, චෝදනාවක්, නඩුවක්, නඩුකරයක්, ඉල්ලීමක්, නඩු නිමිත්තක්, නඩු කටයුත්තක් හෝ නඩු තීන්දුවක් වේ.
- **"පෞද්ගලික දත්ත"** යන්නෙන් අදහස් වන්නේ, යම් තැනැත්තෙකුට සහ ආයතනික සමාගම් වලට අදාළ වන එම තැනැත්තා හඳුනාගැනීමට හැකිවන ආකාරයේ, සංවේදී පුද්ගලික දත්ත, නම (නම්), පදිංචි ලිපිනය (ලිපින), සම්බන්ධවීමේ තොරතුරු, වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය, පුරවැසිභාවය, පුද්ගලික හා වෛවාහික තත්ත්වය ද ඇතුළත්ව, ඕනෑම දත්තයක් වේ.
- **"සේවාවන්"** යන්නෙන්, (a) ගනුදෙනුකරුගේ බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම, (b) ණය පහසුකම් හා වෙනත් බැංකුකරණ සැලසුම් හා සේවාවන් ගනුදෙනුකරුට සැපයීම (උදාහරණ ලෙස, වස්තුභාර ගනුදෙනු, ආයෝජන උපදෙස්, තැරැව්කාර සේවා, නියෝජිත සේවා, භාරකාරත්ව, නිශ්කාශන හෝ තාක්ෂණ ප්‍රවර්ථන සේවාවන් ද ඇතුළත් ව), අයදුම්පත් සැකසුම, අතිරේක ණය තක්සේරු හා සැලසුම් සඳහා සුදුසුකම් තක්සේරු, සහ (c) මූල්‍ය සේවා හෝ ඊට ආශ්‍රිත සැලසුම් ගනුදෙනුකරු වෙත අලෙවිකරණය හෝ ප්‍රවර්ධනය, අලෙවි සමීක්ෂණය, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව ගනුදෙනුකරුවා සමග කාගිල්ස් බැංකුවෙහි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම, ඊට සීමා නොවී, අදහස් වේ.
- **"ප්‍රාමාණික හිමිකරුවන්"** යන්නෙන් අදහස් වන්නේ, යම් ආයතනයක ලාභයෙන් 10%ක ට වඩා හිමිකම් දරන හෝ සෘජුව හෝ වක්‍රව 10%ක ට වඩා අයිතිය සහිත තැනැත්තෙකු වේ.
- **"බදු අධිකාරීන්"** යන්නෙන් අදහස් වන්නේ, දේශීය හෝ විදේශීය බදු, ආදායම්, ෆිස්කල් හෝ මුදල් අධිකාරීන් ය.

- **"බදු තොරතුරු"** යන්නෙන්, ගනුදෙනුකරුවෙකුගේ (එම ගනුදෙනුකරු පුද්ගලයෙකු හෝ ලාභ නොලබන හෝ වෙනත් වාණිජ ආයතනයක් වන ව්‍යාපාරයක් වුවද, ඒ බව නොසලකා) සහ සාධාරණව ක්‍රියාකිරීමේ දී යම් බදු අධිකාරියක් වෙත ඇති කාගිල්ස් බැංකු සමූහයේ යම් සාමාජිකයෙකුගේ බැඳීම්වලට අනුකූලව ක්‍රියාකිරීම අවශ්‍ය යැයි කාගිල්ස් බැංකුව විසින් සලකනු ලබන යම් හිමිකරුවෙකු "පාලක පුද්ගලයෙකු", "ප්‍රාමාණික හිමිකරුවෙකු" හෝ ගනුදෙනුකරුවෙකුගේ අර්ථලාභී හිමිකරුවෙකුගේ බදු තත්ත්වයට සෘජුව හෝ වක්‍රව අදාළ වන යම් ලේඛනයක් හෝ තොරතුරක් අදහස් වේ. "බදු තොරතුර" යන්නට බදු නේවාසිකත්වය සහ/හෝ ආයතනයේ ස්ථානය (අදාළ පරිදි), බදු වාසය, බදු හැඳුනුම් අංකය, බදු සහතික කිරීමේ ආකෘතිපත්‍ර, {නම(නම්), නේවාසික ලිපිනය(ලිපින), වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය හා පුරවැසි භාවය ද ඇතුළත් ව} ආදී ඇතැම් පුද්ගලික දත්ත පිළිබඳ තොරතුරු ද ඇතුළත් වන නමුත්, ඊට සීමා නොවේ.
- **"බදු සහතික කිරීමේ ආකෘතිපත්‍ර"** යන්නෙන් අදහස් වන්නේ, ගිණුම් හිමියෙකුගේ හෝ ආයතනයක සම්බන්ධිත පුද්ගලයෙකුගේ බදු තත්ත්වය තහවුරු කිරීම සඳහා බදු අධිකාරීන් හෝ කාගිල්ස් බැංකුව විසින් කලින් කලට නිකුත් කරන හෝ නියම කරනු ලබන ඕනෑම ආකෘති පත්‍රයක් හෝ ලේඛනයක් වේ.

පහත දැක්වෙන නීතිරීති සහ කොන්දේසි මගින් කාගිල්ස් බැංකුවේ සියලුම ව්‍යාපාරික ගිණුම් පාලනය වනු ඇත:

1. ව්‍යාපාරික ගිණුම් විවෘත කිරීමේ යෝග්‍යතා උපමානයන්

1.1 ඉතුරුම්, ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම් ද ඇතුළත්ව නමුත්, ඊට සීමා නොවී ව්‍යාපාරික ගිණුමක් (සමස්තයක් ලෙස ගිණුම/ගිණුම් යනුවෙන් හැඳින්වේ) වගකීමෙන් සීමිත සමාගම් හෝ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතනයක/සංවිධානයක නමින් ආරම්භ කළ හැකිය (මෙම නීතිරීති හා කොන්දේසි වල එකී ආයතන මින් මතුවට මෙහි සමහර තැන් වල ගිණුම් හිමියා/හිමියන් ලෙස සහ/හෝ ගනුදෙනුකරු/කරුවන් ලෙස හැඳින්වෙනු ඇත).

1.2 අදාළ ගිණුම, ජංගම ගිණුමක් නම්, එය 1.1 වගන්තියෙහි දැක්වෙන පුද්ගලයන් විසින් විවෘත කළ හැකි අතර, අදාළ ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත, විවෘත කරනු ලබන ගිණුම් වර්ගයට අදාළ වෙනත් නීතිමය සහ සහය ලේඛන සමග, අවශ්‍ය වන්නේ නම් හඳුන්වාදීමේ ලිපියක් ද සමග ඉදිරිපත් කළ යුතු වේ.

1.3 බැංකුව විසින් භාරයන් පිළිනොගනී. කෙසේ වුවද, විශේෂ අවස්ථා වලදී බැංකුව විසින් ස්වකීය පූර්ණ අභිමතයට අනුව භාරයන් සම්බන්ධයෙන් ගිණුම් විවෘත කරනු ලැබිය හැකිය.

1.4 සෑම ගිණුමකටම ගිණුම් අංකය යනුවෙන් හැඳින්වෙන වෙනම අංකයක් ලබාදෙන අතර, බැංකුව සමග සිදුකරන සියලු ලිපි ගනුදෙනු වලදී සහ සියලුම මූල්‍ය (තැන්පතු, මාරු කිරීම්, විමසීම්, ලදුපත් මගින් ගෙවීමේ පත්‍රිකා, සහ ආපසු ගැනීමේ ආකෘතිපත්‍ර) සහ මූල්‍ය නොවන ගනුදෙනු ලේඛන වල එම අංකය සඳහන් කළ යුතු වේ.

1.5 ගිණුමෙහි පාර්ශ්වකරුවෙකු (අධ්‍යක්ෂ/ප්‍රධාන කොටස් හිමි/ ගිණුමෙහි අවසන් අර්ථලාභී හිමිකරු) අදාළ පරිදි ඉල්ලා අස්වූ විටෙක සහ/හෝ මියගියහොත් ගිණුමෙහි බලයලත් අත්සන්කරු/ අත්සන්කරුවන් විසින් ඒ බව තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන ද සමග ඒ බව වහාම බැංකුව වෙත දැනුම්දිය යුතු වේ.

1.6 බැංකුව විසින් දැනුම්දීමක් රහිතව, බැංකුව වෙත පවතින වගකීම්, එම වගකීම් අහඹු, ප්‍රාථමික, හෝ සහායක, හවුල් හෝ වෙන් වෙන් වගකීම් වුවද ඒ සමග ගිණුමක්/ගිණුම් සම්බන්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ එවැනි ගිණුම් වල බැර වී පවතින මුදලක්/මුදල් ගිණුම් හිමියාට වෙනත් යම් ගිණුමක් මත හෝ වෙනත් යම් ආකාරයකින් බැංකුවෙන් ගෙවිය යුතුව පවතින වෙනත් යම් මුදලක්/මුදල් පියවා ගැනීම හෝ මාරු කිරීම සිදුකළ හැකිය.

1.7 හානිපූරණයක් ලබාගැනීමට යටත්ව, බැංකුවේ අභිමතය පරිදි ලබාදිය හැකි, බැංකුව සහ ගිණුම් හිමියා/හිමියන් අතර නිශ්චිත ගිවිසුමක් නොමැතිව ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයන් හරහා ලබාදෙන උපදෙස් මත බැංකුව විසින් ක්‍රියා නොකරනු ඇත.

1.8 ගිණුම, ජංගම ගිණුමක් නම් එහි බැර වී පවතින ශේෂය මත බැංකුව විසින් පොලියක් නොගෙවනු ඇත.

2. තැන්පතු

2.1 ගිණුමක් සඳහා අවශ්‍ය වන මූලික තැන්පතු මුදල සිය අභිමතය පරිදි, බැංකුව විසින් පූර්ව දැනුම්දීමකින් තොරව, 11.5 වගන්තියට යටත් ව, කලින් කලට වෙනස් කළ හැකිය; බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි අඩු මූලික තැන්පතුවක් සහිතව ගිණුමක්/ගිණුම් විවෘත කිරීම කළ හැකිය.

2.2 බැංකුව විසින් සිය තනි අභිමතය මත, මුදල් අණකර සහ/හෝ බැංකුව වෙත නොලියන ලද වෙනත් ගෙවීම් නියෝග මිලදී ගත යුතු ද නැතහොත් එකතුකර යැවිය යුතු ද යන්න තීරණය කරනු ඇත. ගෙවන බැංකුව වෙතින් පසු අවස්ථාවක දී අගරුවීමක දී, මිලදීගන්නා ලද සියලුම අයිතමයන් සම්බන්ධයෙන් බැංකුවට පූර්ණ අයකරගැනීමේ බලය (ගාස්තු ද ඇතුළත්ව) පවතිනු ඇති අතර, අගරුවීමේ දැන්වීම බැංකුව වෙත ලැබුණු පසුව ගිණුම හර කෙරෙනු ඇත.

2.3 බැංකුව වෙත ලියන ලද අණකර/චෙක්පත් ගිණුමෙහි බැරට ගෙවන ලද අවස්ථාවක බැංකුව විසින් පළකර ඇති ගාස්තු වලට අනුකූලව ගාස්තුවක් අඩු කරගනු ඇත. බැංකුව වෙත නොලියන ලද අණකර/චෙක්පත් මිලදී ගෙන ගිණුමට බැර කරන ලද විට, එසේ ගිණුම බැර කරන අවස්ථාවේ සාධනපත්‍රයේ මුහුණත වටිනාකමෙන් අයකරන හැසිරවීමේ ගාස්තුවට අමතරව බැංකුව විසින් වට්ටම් ගාස්තු ද අඩුකරගනු ඇත.

2.4 ගිණුමට තැන්පත් කරනු ලැබීමෙන් පසු බැර කරනු ලැබ ඇති වෙනත් බැංකු වල චෙක්පත් වල මුදල් ආපසු ගැනීමට හැකි වන්නේ එම චෙක්පත් උපලබ්ධි වීමෙන් පසුව පමණි. වෙනත් බැංකු මත ලියන ලද සහ නිශ්කාශනය/එකතු කරගැනීම සඳහා තැන්පත් කර ඇති

චෙක්පත් ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගමේ සියලු සංශෝධන ඇතුළත් නීතිරීති හා රෙගුලාසි සහ ඊට අදාළ වෙනත් නීතිරීති හා රෙගුලාසි සහ/හෝ කලින් කලට අදාළ වන අණපනත් වලට යටත් වනු ඇත. චෙක්පත් ලියන ලද බැංකු විසින් අයකරනු ලබන කොමිස් මුදල් ඇත්නම් බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ඒවා අධිභාරයක් සහිතව හෝ රහිතව අදාළ ගිණුම් වලින් හර කෙරෙනු ඇත.

2.5 මුදල් නොවන තැන්පතු වලට ඔබගේ පූර්ණ නෛතික හිමිකම පවතින බවට ඔබ විසින් නිදේශනය කර තහවුරු කරන අතර, මූල්‍ය නොවන තැන්පතු වල ඇති අත්සන්, පිටසන් සහ විස්තර වල නිර්ව්‍යාජ භාවය, වලංගු භාවය සහ නිවැරදි භාවය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම භාරගනියි.

2.6 ගිණුම් හිමියා කැමති ඕනෑම වාර ගණනක් ගිණුමෙහි මුදල් තැන්පත් කළ හැකිය. බැංකුවේ කවුන්ටර මගින් සිදුකරන සියලුම තැන්පතු, තැන්පතු පත්‍රිකාවක් වලංගු කිරීම මගින් හෝ තැන්පතු පත්‍රිකාව මත බැංකුවේ බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් තබා පිළිගනු ලැබේ.

2.7 බැංකුවෙහි එක් එක් ශාඛාවේ නිශ්චය කර ඇති අවසන් වේලාව තෙක් තැන්පත් කර ඇති චෙක්පත් එදිනම නිශ්කාශනය සඳහා යෙදවෙනු ඇත. අවසන් වේලාවට පසුව තැන්පත් කරනු ලබන චෙක්පත් ඊළඟ වැඩකරන දිනයේදී නිශ්කාශනය සඳහා යෙදවෙනු ඇත.

2.8 බැංකුව විසින් වැරදීමකින් ගිණුමට බැර කරන ලද විටෙක ඕනෑම අවස්ථාවක එකී ඇතුළත් කිරීම ආපසු හැරවීමට සහ ගිණුමෙන් හර කිරීමට සහ/ හෝ එකී මුදල ගිණුම් හිමියා වෙතින් ඉල්ලා සිටීමට බැංකුවට හිමිකම පවතී.

2.9 බැංකුව විසින් ස්වකීය පූර්ණ අභිමතය පරිදි වත්කම් ලද මූලාශ්‍රයට සහ/හෝ ගිණුම් හිමියාගේ අරමුදල් වල මූලාශ්‍රයට අදාළ තොරතුරු, එම තොරතුරු වල තහවුරු කිරීමක් ද සහිතව ඉල්ලා සිටීමට හැකිය.

3. චෙක්පොත්

3.1 ගිණුම, රුපියල් ජංගම ගිණුමක් වූ විට, ඉල්ලීමක් මත, ගිණුම් හිමියා/හිමියන් වෙත චුම්භක තීන්ත අකුරු හඳුනාගැනීම සහිතව මුද්‍රණය කළ චෙක්පොතක්/පොත් සපයනු ඇත. රජයේ පවත්නා මුද්දර ගාස්තු සහ චෙක්පොත් මුද්‍රණ පිරිවැය ඇතුළත් වන ගාස්තුවක් චෙක්පොත් සඳහා ගිණුම් හිමියා වෙතින් අය කෙරෙනු ඇත.

3.2 චෙක්පොත් සඳහා වන සියලුම අයදුම්පත් ඉල්ලීම් ලැබීමෙන් අනතුරුව, ගිණුම් හිමියා/හිමියන් විසින් හෝ අභිනියෝජනය කරන ලද පුද්ගලයෙකු (පූර්ව වශයෙන් නම්කරන ලද) විසින් එය ලබාගැනීම මගින් හෝ බැංකුවේ වාර්තාගත වී ඇති ලිපිනය වෙත තැපැලෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත අවශ්‍ය චෙක්පොත් යවනු ඇත. කිසියම් යැවීමේ ක්‍රමවේදයක් මගින් මතුවන යම් ප්‍රමාදයක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

3.3 නව චෙක්පොතක් ලැබීමෙන් පසුව, ගිණුම් හිමියා/හිමියන් විසින් එය භාවිත කිරීමට පෙර චෙක්පත් අනුක්‍රමික අංකයන්, ගිණුම් අංකය හා ගිණුම් හිමියා/හිමියන් ගේ නම ඒ මත මුද්‍රිත ද යන බව හා චෙක්පත් ගණන තහවුරු කරගත යුතුය. කිසියම් අක්‍රමිකතාවක් වේ නම්, වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

3.4 යම් චෙක්පතක් ලිවීමට පෙර, ගිණුම් හිමියා/හිමියන් විසින් චෙක්පොතෙහි කවරයේ ඇතුළත මුද්‍රිත, නිකුත් කිරීමේ කොන්දේසි කියවිය යුතුය. එම කොන්දේසි මඟින් සහ කලින් කලට සිදුකරනු ලබන නිකුත් කිරීමේ කොන්දේසි සංශෝධනය කිරීම් මඟින් ගිණුම් හිමියා/හිමියන් බැඳී සිටිනු ඇත.

3.5 බැංකුව වෙත ලබාදෙන ලද මැන්ඩේටය හා ආදර්ශ අත්සනට (අත්සන් වලට) අනුව ගිණුම් හිමියා/හිමියන් විසින් චෙක්පත් අත්සන් කළ යුතුය. බලයලත් අත්සන හෝ අත්සන්කරුවන් සම්බන්ධයෙන් සිදුවන වෙනස්කම්, ගිණුම් හිමියන් විසින් වහාම බැංකුව වෙත ලිඛිතව දැන්විය යුතුය.

3.6 වංචනික වෙනස් කිරීම් සිදුකළ නොහැකි වන ආකාරයට හෝ බැංකුව නොමග නොයන හෝ මුලා නොවන ආකාරයට චෙක්පත් ලිවීම සිදුකළ යුතු වේ.

3.7 චෙක්පත් ස්ථිර තීන්ත වලින් පැහැදිලිව ලිවිය යුතු වන අතර, බැංකුව විසින් සපයා ඇති චෙක්පත් මත පමණක් ලිවිය යුතුය. එක් එක් වෙනස් කිරීම, ලියන්නාගේ සම්පූර්ණ අත්සන/අත්සන් සහිතව තහවුරු කළ යුතුය. වහාම දැකගත නොහැකි වෙනස් කිරීම් මඟින් පැන නගින පාඩු සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නොසිටින බව ගිණුම් හිමියා/ හිමියන් පිළිගනියි.

3.8 චෙක්පත් නැතිවී/සොරාගෙන හෝ අස්ථානගත වුවහොත්, ගිණුම් අංකය, චෙක්පත් අංකය, දිනය, මුදල හා ගෙවනු ලබන්නාගේ නම දක්වමින් ගිණුම් හිමියා/හිමියන් විසින් වහාම ගෙවීම් නතර කිරීමට බැංකුව වෙත ලිඛිතව උපදෙස් දිය යුතුය. එවැනි උපදෙසක් ලැබෙන වේලාව තෙක් අදාළ චෙක්පත/චෙක්පත් සඳහා ගෙවීම් සිදුකර නොමැති නම් පමණක් එම සියලු උපදෙස් ක්‍රියාත්මක වනු ඇත. දුරකථනය මඟින් ගෙවීම් නතරකරන ලෙසට ලබාදෙන උපදෙස් පැය 48ක් තුළ ලිඛිතව තහවුරු කළ යුතුය. පැය 48ක් තුළ එම ලිඛිත උපදෙස් නොලැබෙන්නේ නම්, ගිණුම් හිමියා/හිමියන් වෙත කිසිදු දැනුම් දීමකින් තොරව ගෙවීම් නතර කිරීමේ උපදෙස් අවලංගු කිරීමට බැංකුවට අයිතිය පවතී. පැය 48ක් තුළ ලිඛිතව තහවුරු නොකළ ගෙවීම් නතර කිරීමේ උපදෙස් මත ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නැත.

3.9 භාවිත නොකරන විට චෙක්පොත් ආරක්ෂිත ස්ථානයක තබා තිබෙන බවට ගිණුම් හිමියා/හිමියන් විසින් සහතික විය යුතුය.

4. මුදල් ආපසු ගැනීම්

4.1 බැංකුව සමග ඇතිකරගන්නා විශේෂ පූර්ව සූදානමකින් හැර ගිණුම් හිමියා විසින් සිය ගිණුම අයිරා නොකළ යුතුය. ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති නම්, චෙක්පත් අගරු කිරීමට බැංකුවට අයිතිය ඇත. අගරු වන සෑම චෙක්පතක් සඳහාම ගිණුම් හිමියා වෙතින් ගාස්තු අයකිරීමට ද බැංකුව අයිතිය රඳවා ගනියි. බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි ගිණුම අයිරා කරමින් චෙක්පතක්/චෙක්පත් සඳහා ගෙවීම් සිදුකළ හැකිය. එවැනි අවස්ථාවක දී, ඉල්ලූ විටෙක කොන්දේසි විරහිතව, පොලිය හා බැංකු ගාස්තු ඇතුලුව අයිරා වූ මුදල ආපසු ගෙවීමට ගිණුම් හිමියා/හිමියන් බැඳී සිටියි. බැංකුව විසින් කිසියම් අයිරා පහසුකමක් ලබාදීමට බැඳී ඇති ලෙසට ප්‍රකාශිත හෝ ව්‍යංග ආකාරයේ එකඟතාවක් ලෙස මෙය අර්ථනිරූපණය නොකළ යුතුය.

4.2 ගනුදෙනු මත, නීති මඟින් කලින් කලට නියම කරනු ලබන රජයේ පවත්නා සියලු අයකිරීම් හා බදු, ගිණුම් හිමියා/හිමියන් වෙතින් අයකෙරෙනු ඇත. නීතියෙහි ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම් හිමියා/හිමියන්ට දරන්නට සිදුවන අයැදීම් හා පාඩු සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

4.3 ගනුදෙනුකරුගේ ඉල්ලීම මත බැංකුව විසින් ගෙවීම් අණකර නිකුත් කරනු ඇත. ගෙවීම් අණකරයක් නිකුත් කළ පසු, ගනුදෙනුකරු විසින් හානිපූරණ ලිපියක් ද සමග ගෙවීම් අණකරයේ මුල් පිටපත සපයනු නොලැබුවහොත් බැංකුව විසින් එය අවලංගු කිරීමේ ඉල්ලීමක් පිළිනොගනු ඇත.

5. වාර ගිණුම් ප්‍රකාශන

5.1 ගිණුම් වල සියලු ගනුදෙනු සම්බන්ධ වාර්තා, කාගිල්ස් බැංකුව විසින් එවන ගිණුම් ප්‍රකාශනයෙහි (කඩදාසි ප්‍රකාශන සහ විද්‍යුත් තැපැල් මගින් එවනු ලබන ප්‍රකාශන වල) සඳහන් වනු ඇත. මෙම නීතිරීතිවලට අනුකූලව, බැංකුවෙහි වාර්තා වල සඳහන් තැපැල්/විද්‍යුත් තැපැල් ලිපිනය වෙත, ගිණුම් හිමියා/ගිණුම් හිමියන් විසින් බැංකුව වෙත උපදෙස් ලබා දී ඇති පරිදි, වාර පදනමින් එම ගිණුම් ප්‍රකාශන ගිණුම් හිමියා/හිමියන් වෙත තැපැල්/විද්‍යුත් තැපැල් මගින් එවනු ලැබේ.

5.2 ප්‍රකාශන චක්‍රය අවසානයේ වැඩකරන දින 10ක් ඇතුළත ගිණුම් ප්‍රකාශනය නොලැබුණහොත් බැංකුව වෙත දැනුම්දිය යුතු වේ. බැංකුව වෙතින් ලැබෙන එක් එක් ගිණුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් යම් වංචනික, කූට අත්සන්, සොරකම්, සහ ගිණුම් හිමියා/හිමියන්ගේ හෝ වෙනත් ඕනෑම අයෙකුගේ බලතල වල යම් අඩුපාඩුවක් හෝ නොසැලකිල්ල ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, යම් වරදක්, අතහැරීමක්, අක්‍රමිකතාවක්, අනවසර හර කිරීම් හෝ වෙනත් ගනුදෙනු හෝ ඇතුළත් කිරීම් ද ඇතුළත් දැන් පරීක්ෂා කර බැලීමට ගිණුම් හිමියා/හිමියන් එකඟ වේ. කිසියම් වරදක් තිබේ නම්, ප්‍රකාශනය ලැබී දින 14ක් ඇතුළත බැංකුව වෙත දැනුම්දිය යුතු වේ. සමාලෝචන කාලසීමාවේ දී බැංකුව වෙත දැනුම්දීමට ගිණුම් හිමියා/හිමියන් අපොහොසත් වුවහොත්, ගිණුම් ප්‍රකාශනයේ

දැක්වෙන ශේෂය සහ ගිණුමෙහි අක්‍රමිකතා ද ඇතුලුව එහි ඇති සියලුම ඇතුළත් කිරීම් නිවැරදි, සම්පූර්ණ, අවසරලත් සහ ගිණුම් හිමියා/හිමියන් මත බන්ධනීය ලෙස සැලකෙනු ඇති අතර, මෙම වගන්තියට අනුකූලව ගිණුම් හිමියා/හිමියන් විසින් දැනුම්දීමක් සිදුකර ඇති ගනුදෙනු සම්බන්ධයෙන් හැර ඉතාම මෑත ගිණුම් ප්‍රකාශනයේ දිනය දක්වා සිදුව ඇති සියලුම ගනුදෙනු සඳහා වන ඕනෑම වගකීමකින් බැංකුව නිදහස් කෙරෙනු ඇත.

5.3 ගිණුම් හිමියා/හිමියන් විසින් ගිණුමෙහි ප්‍රකාශන වල පිටපත් සංරක්ෂණය කිරීමට වගබලාගත යුතුය. ගිණුම් ප්‍රකාශන වල පිටපත් බැංකුව වෙතින් ඉල්ලා සිටියහොත් එම සේවාව සැපයීම සඳහා, බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අයක්‍රමයට අනුව ගාස්තු අය කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

6. පාරිභෝගික තොරතුරු එකතුකිරීම, සැකසුම හා හුවමාරු කරගැනීම එකතුකිරීම

6.1 එකතුකිරීම

කාගිල්ස් බැංකුව විසින් පාරිභෝගික තොරතුරු (ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ගනුදෙනු, ගනුදෙනුකරු විසින් කාගිල්ස් බැංකුවේ සැලසුම් හා සේවාවන් භාවිතය සහ කාගිල්ස් බැංකුව සමග ගනුදෙනුකරුගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතුකිරීම, භාවිත කිරීම හා බෙදා-හදා ගැනීම සිදුකළ හැක. පාරිභෝගික තොරතුරු, ගනුදෙනුකරු (හෝ ගනුදෙනුකරු වෙනුවෙන් කටයුතු කරන වෙනත් අයෙකු) වෙතින් ඉල්ලා සිටිය හැකි අතර, එසේ නොමැති නම්, කාගිල්ස් බැංකුව විසින් හෝ වෙනුවෙන් වෙනත් මූලාශ්‍ර (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව) වෙතින් එකතුකර ගෙන කාගිල්ස් බැංකුව සතුව ඇති වෙනත් තොරතුරු සමග ඒවා උත්පාදන කිරීම හෝ ඒකාබද්ධ කිරීම සිදුකළ හැකිය.

6.2 සැකසුම

කාගිල්ස් බැංකුව විසින් පහත අරමුණු උදෙසා පාරිභෝගික තොරතුරු සැකසීම, පැවරීම, හා හෙළිදරව් කිරීම සිදුකරනු ඇත. (a) ගනුදෙනුකරු විසින් ඉල්ලා සිටින ලද හෝ අවසර දෙන ලද යම් ගනුදෙනුවක් සඳහා සේවාවන් සැපයීම, (b) අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීම, (c) මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදුකිරීම, (d) ගනුදෙනුකරු වෙතින් අයවිය යුතු යම් මුදලක් එකතුකර ගැනීම, (e) ණය පරීක්ෂා සිදුකිරීම හා ණය තොරතුරු ලබාගැනීම හෝ සැපයීම (f) කාගිල්ස් බැංකුවේ, හෝ කාගිල්ස් බැංකු සමූහයේ සාමාජිකයෙකුගේ අයිතීන් බලාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම (g) කාගිල්ස් බැංකුවෙහි හෝ කාගිල්ස් බැංකු සමූහයෙහි අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සඳහා (ණය හා අවදානම් කළමනාකරණය, පද්ධති හෝ සැලසුම් සංවර්ධනය හා සැලසුම්කරණය, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව, ඊට සීමා නොවී), (h) පාරිභෝගිකයා සමග කාගිල්ස් බැංකුවේ සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම (මූල්‍ය සේවා හෝ ආශ්‍රිත සැලසුම් ගනුදෙනුකරු වෙත අලෙවිය හෝ ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳපොළ සමීක්ෂණ ද ඇතුළත්ව) (‘‘අරමුණු’’).

6.3 බෙදා-හදා ගැනීම

කාගිල්ස් බැංකුව විසින් (අරමුණ සඳහා අවශ්‍ය හා සුදුසු පරිදි) පහත ලැබුම්කරුවන් වෙත පාරිභෝගික තොරතුරු පැවරීම හෝ හෙළිදරව් කිරීම කළ හැකි බවට (අරමුණු සඳහා පාරිභෝගික තොරතුරු සැකසීම, පැවරීම හා හෙළිදරව් කිරීම ලැබුම්කරුවන් විසින් ද සිදු කළ හැකිය) සේවාවන් භාවිත කිරීම මඟින් ගනුදෙනුකරුවා එකඟ වෙයිඃ

a) කාගිල්ස් බැංකුවේ යම් උප-කොන්ත්‍රාත්කරුවෙකු, නියෝජිතයෙකු, සේවා සපයන්නෙකු, හෝ සම්බන්ධිත ආයතනයක් (ඔවුන්ගේ සේවකයින්, අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් ඇතුළත්ව);

b) ගනුදෙනුකරු, ගෙවීම් ලැබුම්කරුවන්, අර්ථලාභීන්, ගිණුම් නාමිකයින්, අතරමැදි හා නියෝජිත බැංකු, නිශ්කාශන ආයතන, නිෂ්කාශන හෝ පියවීමේ පද්ධති, වෙළඳපොළ ප්‍රතිපාර්ශ්වයන්, රඳවාගැනීමේ නියෝජිතයින්, හුවමාරු හෝ වෙළඳ මූලාශ්‍ර කොටස් හුවමාරු, කොටස් වෙළඳපොළ, ගනුදෙනුකරුට සුරැකුම්පත් (එම සුරැකුම්පත් ගනුදෙනුකරු වෙනුවෙන් කාගිල්ස් බැංකුව විසින් දරන අවස්ථාවක දී) පිළිබඳව ගනුදෙනුකරුට අයිතියක් ඇති සමාගම් වෙනුවෙන් ක්‍රියාකරන යම් කිසිවෙකු;

c) සේවාවන් හි දී හෝ සේවාවන් සම්බන්ධයෙන් අයිතියක් ලබාගන්නා හෝ අවදානමක් භාරගන්නා යම් පාර්ශ්වයක්;

d) ණය තොරතුරු ලබාගැනීම හා සපයාදීම සඳහා වෙනත් මූල්‍ය ආයතන, ණයවර විමසීමේ නියෝජිත ආයතන, හෝ ණය තොරතුරු කාර්යාංශ, විගණකවරුන්/බදු උපදේශකවරුන්;

e) ගනුදෙනුකරු වෙත වත්කම් කළමනාකරණ සේවාවන් සපයන යම් තෙවන පාර්ශ්වයක අරමුදල් කළමනාකරුවෙකු;

f) කාගිල්ස් බැංකුව විසින් හඳුන්වාදීම් හෝ යොමුකිරීම් සපයනු ලබන යම් හඳුන්වාදීමේ අතරමැදියෙකු;

7. පාරිභෝගිකයාගේ බැඳීම්

7.1 කාගිල්ස් බැංකුව වෙත සපයා ඇති පාරිභෝගික තොරතුරුවල යම් වෙනසක් සිදුව ඇත්නම් කලින් කලට, කවර අවස්ථාවක දී වුවද දින තිහ (30)ක් ඇතුළත වහාම කාගිල්ස් බැංකුව වෙත ලිඛිත ව දැනුම්දීමට ද කාගිල්ස් බැංකුව වෙතින් ලැබෙන යම් ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ද පාරිභෝගිකයා එකඟ වෙයි.

7.2 සෑම සම්බන්ධිත තැනැත්තෙකු/තැනැත්තන්, ඔවුන් විසින් කාගිල්ස් බැංකුව හෝ කාගිල්ස් බැංකු සමූහයේ යම් සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික තොරතුරු හෝ බදු තොරතුරු ඇතුළත් ව) සපයා ඇති යම් තැනැත්තෙකු හට මෙම නීතිරීතිවල දක්වා ඇති ආකාරයට ඔවුන්ගේ තොරතුරු සැකසුම, හෙළිදරව් කිරීම හා පැවරීම සම්බන්ධව දන්වා ඇති බවට හා එකඟ වී ඇති බවට ගනුදෙනුකරු තහවුරු කරයි. සිය පෞද්ගලික දත්තවලට ප්‍රවේශවීමට සහ ඒවා නිවැරදි කිරීමට එම සම්බන්ධිත තැනැත්තන්/ එවැනි තැනැත්තන් හට අයිතිය ඇති බවට ගනුදෙනුකරු ඔවුන් වෙත උපදෙස් දිය යුතුය.

7.3 යම් අවස්ථාවක:

a) කාගිල්ස් බැංකුව විසින් සාධාරණව ඉල්ලා සිටින පාරිභෝගික තොරතුරු සපයා දීමට ගනුදෙනුකරු අපොහොසත් වුවහොත්; හෝ අරමුණු සඳහා තොරතුරු සැකසුම, පැවරීම හෝ හෙළිදරව් කිරීමට කාගිල්ස් බැංකුව විසින් අවශ්‍ය කෙරෙන යම් කැමැත්ත පළකිරීමක් ගනුදෙනුකරු විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කරගතහොත්; හෝ මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ හැකියාව පිළිබඳව කාගිල්ස් බැංකුවට සැක පහළ වන අවස්ථාවක දී; හෝ ගනුදෙනුකරු වෙතින් කාගිල්ස් බැංකුව වෙත මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ අවදානමක් ඇතිවන අවස්ථාවක දී, කාගිල්ස් බැංකුව විසින්:

ගනුදෙනුකරු වෙත නව සේවාවන් හෝ සියලු සේවාවන් හෝ ඉන් කොටසක් අඛණ්ඩව සැපයීමට නොහැකි විය හැකි අතර, ගනුදෙනුකරු සමග සිය ව්‍යාපාරික සබඳතා අවසන් කර දැමීමට අයිතිය රඳවා ගනියි;

අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීමට කාගිල්ස් බැංකුවට අවශ්‍ය වන යම් පියවර ගැනීම සහ/හෝ ගනුදෙනුකාර ගිණුම (ගිණුම්) අවහිර කිරීම, පැවරීම හෝ වසා දැමීම කළ හැකිය.

8. දත්ත ආරක්ෂා

8.1 සැකසුම් සිදුකරන ලද්දේ දේශීය බලප්‍රදේශයක හෝ විදේශයක වුවද, දත්ත ආරක්ෂක ව්‍යවස්ථාවකට අනුකූලව, සියලුම කාගිල්ස් බැංකු සමූහ සාමාජිකයින්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හා තෙවන පාර්ශ්වයන් යටත් වන දැඩි රහස්‍ය හා ආරක්ෂක ආචාරධර්ම පද්ධතියක් මඟින් පාරිභෝගික තොරතුරු ආරක්ෂා කෙරෙනු ඇත.

9. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්

9.1 මූල්‍ය අපරාධ ("මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකරකම්") නිරීක්ෂණය, විමර්ශනය හා වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇති නීති, රෙගුලාසි, සම්බාධක රෙජිමයන්, ජාත්‍යන්තර මඟපෙන්වුම්, අභ්‍යන්තර ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සහ/හෝ යම් බලධාරියෙකු වෙතින් ලැබෙන ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීමට කාගිල්ස් බැංකුව විසින් සුදුසු යැයි සිතන යම් පියවර (ඔවුන්ගේ තනි සහ පරම අභිමතය පරිදි) ගත යුතු වන අතර, එසේ පියවර ගනු ඇත. එම පියවරවලට: (a) යම් උපදෙසක්, සන්නිවේදනයක්, මුදල් ඉපදවීමේ ඉල්ලීමක්, සේවාවන් සඳහා අයදුම් කිරීමක් හෝ ගනුදෙනුකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යවන ලද හෝ ලබන යම් ගෙවීමක් නිරීක්ෂණය, හසුකරගැනීම හා විමර්ශනය කිරීම, (b) අරමුදල්වල මූලාශ්‍රය හෝ අරමුණු කරන ලද ලැබුම්කරුවන් පිළිබඳව විමර්ශනය කිරීම, (c) කාගිල්ස් බැංකුව සතු අනෙකුත් ආශ්‍රිත තොරතුරු සමග පාරිභෝගික තොරතුරු සම්බන්ධ කිරීම සහ/හෝ (d) පුද්ගලයෙකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් ඔවුන්

සම්බාධක රෙජීමයකට යටත් වන්නේදැයි වැඩිදුර විමසීම, හෝ ගනුදෙනුකරුගේ අනන්‍යතාව හා තත්ත්වය තහවුරුකරගැනීම ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

9.2 ව්‍යාතිරේක ලෙස, කාගිල්ස් බැංකුව විසින් මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් භාරගැනීම මඟින් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිෂ්කාශනය, පාරිභෝගික උපදෙස් සැකසුම හෝ සේවාවන් සඳහා අයදුම් කිරීම හෝ සේවාවන් සියල්ල හෝ එයින් කොටසක් සැපයීම ප්‍රමාද වීම, අවහිර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කාගිල්ස් බැංකුව වෙතින් සිදුවිය හැක. නීතියෙන් අවසර ඇති ප්‍රමාණයට, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කිසියම් ආකාරයකින් ගනුදෙනුකරුට හෝ තෙවන පාර්ශ්වයකට පැන නගින, විඳින්නට හෝ දරන්නට සිදුවන යම් අලාභයක් (අලාභ) සඳහා ගනුදෙනුකරු වෙත හෝ යම් තෙවන පාර්ශ්වයක් වෙත කාගිල්ස් බැංකුව වගකීමට ලක් නොවනු ඇත.

10. බදු අනුකූලතාව

10.1 කාගිල්ස් බැංකුව විසින් සහ/හෝ කාගිල්ස් බැංකු සමූහයේ සාමාජිකයින් විසින් විවෘත කරනු ලබන ගිණුම (ගිණුම්) හෝ සපයන සේවාවන්ට අදාළ බැඳීම් පිළිබඳව සියලුම අධිකරණ බලප්‍රදේශයන් තුළ දී පැන නගින බදු බැඳීම් වලට (බදු ගෙවීම හෝ බදු වාර්තා ඉදිරිපත් කිරීම හෝ අදාළ සියලුම බදු සම්බන්ධයෙන් වන ගෙවීම් ආශ්‍රිත වෙනත් අවශ්‍ය ලේඛන ද ඇතුළත් ව, නමුත් ඊට සීමා නොවී) ගනුදෙනුකරු සහ එක් එක් සම්බන්ධිත පුද්ගලයන් පිළිබඳව වන බදු බැඳීම් වටහාගැනීම හා ඊට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ගනුදෙනුකරු සහ සම්බන්ධිත තැනැත්තන් වශයෙන් කටයුතු කරන එක් එක් සම්බන්ධිත තැනැත්තා (සිය පෞද්ගලික තත්ත්වයෙන් නොව) විසින් සිය තත්ත්වය අනුව සම්පූර්ණයෙන් වගකිව යුතු වන බවට ගනුදෙනුකරු සහ එක් එක් සම්බන්ධිත තැනැත්තන් විසින් පිළිගනු ලබයි. කාගිල්ස් බැංකුව විසින් පිළිගනියි. ගනුදෙනුකරුගේ (හෝ සම්බන්ධිත තැනැත්තාගේ)) ~~හෝ ඔබගේ~~ වාසභූමිය, නේවාසික ස්ථානය, පුරවැසි භාවය හෝ සංස්ථාපිත කිරීම නොසලකා, සමහර රටවලට අමතර- දේශසීමා බලපෑම් සහිත බදු ව්‍යවස්ථාවන් පැවතිය හැක. කාගිල්ස් බැංකුව සහ/හෝ කාගිල්ස් බැංකු සමූහයේ කිසිදු සාමාජිකයෙකු විසින් බදු උපදේශනය සපයනු නොලැබේ. කාගිල්ස් බැංකුව සහ/හෝ කාගිල්ස් බැංකු සමූහයේ කිසියම් සාමාජිකයෙකු විසින් ගිණුම (ගිණුම්) විවෘත කිරීම හා සපයන ලද සේවාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් අදාළ වන බැඳීම් ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, කිසියම් අධිකරණ බලප්‍රදේශයක පැනනගිනු ඇති ගනුදෙනුකරුගේ බදු බැඳීම් සම්බන්ධයෙන් කාගිල්ස් බැංකුව සහ/හෝ කාගිල්ස් බැංකු සමූහයේ කිසිදු සාමාජිකයෙකු හට වගකීමක් නොමැත.

11. **පොදු**

11.1 බැංකුව වෙත ලබා දුන් සියලු තොරතුරු (ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතක හෝ වෙනත් ආකාරයකින් හෝ) ගිණුම් හිමියා/හිමියන්ගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ගිණුම් හිමියා/හිමියන් ප්‍රතිඥා දෙයි.

11.2 ගිණුම් හිමියා/හිමියන්ගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙහි හෝ ලියාපදිංචි කාර්යාල ලිපිනයෙහි, දුරකථන අංකයෙහි, හෝ විද්‍යුත් තැපැල් ලිපිනයෙහි කිසියම් වෙනස්වීමක් සිදුවුවහොත් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

11.3 මේ යටතේ තැපෑලෙන් යවනු ලබන යම් දැන්වීමක් බැංකුව වෙත අවසන් වරට ලිඛිතව දැනුම් දී ඇති ලිපිනයට තැපැල් කිරීමෙන් පසු වැඩකරන දින 07ක් තුළ ගිණුම් හිමියා/ හිමියන් වෙත ලැබී ඇති බවට සැලකෙනු ඇත.

11.4 ගාස්තු ලේඛන අයක්‍රමය;

11.4.1 බැංකුවේ පූර්ණ අභිමතය පරිදි සුදුසු යැයි සිතන ආකාරයට කලින් කලට සේවා ගාස්තු සහ/හෝ වෙනත් ගාස්තු පැනවීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

11.4.2 බැංකුවේ පූර්ණ අභිමතය පරිදි සුදුසු යැයි සිතන ආකාරයට පූර්ව දැනුම්දීමක් රහිතව කලින් කලට සේවා ගාස්තු සහ මෙහි දැක්වෙන නීතිරීති හා කොන්දේසි වලට එකතුකිරීම් සිදුකිරීමට, ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි. බැංකුවේ ගාස්තු අයකිරීමේ ක්‍රමය බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cargillsbank.com හි සහ හෝ ගිණුම් හිමියාට/ හිමියන්ට බැංකුවේ ඕනෑම ශාඛා කාර්යාලයක් වෙතින් ඉල්ලා ලබාගැනීම සහ/හෝ ප්‍රකාශන පණිවුඩයක් මගින් හෝ ලබාදීම සිදුකෙරන අතර, එය ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම්දීමක් ලෙස අර්ථනිරූපණය කළ යුතු වේ.

11.5 බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ගිණුමෙහි පවත්වාගෙන යා යුතු අවම ශේෂය හඳුන්වාදෙනු ඇති අතර, ගිණුම් හිමියා/හිමියන් විසින් එම අවශ්‍යතාව ඉටු නොකරන අවස්ථාවන් හි ගනුදෙනු ගාස්තුවක් සහ/හෝ සේවා ගාස්තුවක් අය කෙරෙනු ඇත.

11.6 ගිණුම්වල දැක්වෙන ප්‍රකාශන, වවුචර, ආපසුගැනීම්/තැන්පතු පත්‍රිකා, චෙක්පත් හෝ ගිණුම් වල දැක්වෙන වෙනත් ඕනෑම ගනුදෙනු වාර්තාවන් හි පිටපත් බැංකුව විසින් තබාගනු ඇත්තේ දක්වා ඇති කාලසීමාවක් සඳහා පමණකි. එවැනි සෑම වාර්තාවක්ම දක්වා ඇති කාලයකට පසුව විනාශ කරනු ඇති අතර, එම කාලයට පසුව ප්‍රකාශනවල හෝ ගනුදෙනු වාර්තාවල පිටපත් සැපයීම සඳහා කිසිදු වගකීමක් හෝ වගවීමක් බැංකුව විසින් භාර නොගනී.

11.7 යම් රුපියල්/විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (නිත්‍ය උපදෙස් ඇතුළත්ව) හර කරමින් ගෙවීම් සිදුකරන ලෙසට බැංකුවේ ශාඛාවන් වෙත තැපෑලෙන් හෝ වැඩ කරන වේලාවන් ඇතුළත ගිණුම් හිමියා/හිමියන් විසින් ගෙනැවිත් භාරදීම මඟින් බැංකුව වෙත ලබාදෙන සහතික කළ ලිඛිත උපදෙස් මත පමණක් බැංකුව විසින් ක්‍රියාකරනු ඇත. නියමිත කාල වකවානුවක් තුළ එකී උපදෙස් මත ක්‍රියා කිරීමට අපොහොසත් වීම තුළින් පැන නඟින කිසියම් හෝ වන්දි, පාඩු හෝ වියදම් පිළිබඳව බැංකුව වගවීමට හෝ වගකීමට ලක් කල නොහැක. අදාළ

විද්‍යුත් ක්‍රමවේද මගින් ගනුදෙනු සිදුකිරීම සඳහා බැංකුව සහ ගිණුම් හිමියා/හිමියන් අතර නිශ්චිත ගිවිසුමක් නොමැතිව, ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයන් හරහා ලබාදෙන උපදෙස් බැංකුව විසින් භාර නොගනු ඇත.

11.8 මුදල් තැන්පතු, මුදල් චෙක්පත් ආපසුගැනීම්, චෙක්පත් තැන්පතු හා වෙනත් හර/බැර ගනුදෙනු සම්බන්ධව, බැංකුවේ තනි අභිමතය පරිදි සිදුකළහොත් හැර, බැංකුව විසින් තැපෑලෙන් ගිණුම් හිමියා වෙත වෙන වෙන ම ගිණුම් පත්‍රිකා එවීම සිදු නොකරනු ඇත.

11.9 ගිණුම් වසා දැමීම

කිසිදු හේතුවක් නොදක්වා, යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

එසේම, ගිණුම් හිමියා/හිමියන්ගේ අවසානයට දැනුම්දී ඇති ලිපිනය වෙත ප්‍රමාණවත් ලිඛිත දැනුම්දීමක් සිදුකිරීමෙන් පසුව කිසිදු හේතුවක් නොදක්වා ගිණුමක් වසා දැමීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

ගිණුමෙහි ශේෂය අඛණ්ඩව මාස හයක කාලයක් ශුන්‍ය හෝ ඊට අඩු (හෝ බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි වෙනත් යම් අවම ශේෂයක්) වන්නේ නම්, ගිණුම වසා දැමීම සම්බන්ධයෙන් වැඩකරන දින 7ක දැනුම්දීමක් ගිණුම් හිමියා/හිමියන්ගේ අවසන් වාර්තාගත ලිපිනය වෙත ලබාදීමෙන් පසුව එම ගිණුම වසා දැමීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

ගිණුම අයථා පරිදි පවත්වාගෙන යාම හේතුවෙන් (ජංගම ගිණුමක් සම්බන්ධයෙන් නම් මුදල් නොපැවතීම හේතුවෙන් චෙක්පත් 3ක ට වඩා අගරු වීම) හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි සහ කලින් කලට බලාත්මකව පවතින රෙගුලාසි වල ප්‍රතිපාදන උල්ලංඝණය වීමක් සිදුව ඇති බවට බැංකුවට සෑහීමකට පත්විය හැකි අවස්ථාවක බැංකුව විසින් ස්වකීය තීරණය පරිදි ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම්දීමකින් තොරව ගිණුමක් වසා දැමිය හැකිය. ලිඛිත දැන්වීමෙහි කාලය ඉකුත්වීමට පෙර ගිණුම් හිමියා/හිමියන් වෙතින් බැහැරකිරීමේ උපදෙස් නොලැබුණහොත්, සමහර අවස්ථාවන් හි දී කොමිස් මුදල් ලෙස චෙක්පත් එකතු කරගැනීමට හෝ ගිණුමෙහි පවතින ශේෂය අවශෝෂණය කරගැනීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

බැංකුව විසින් පූර්ව දැනුම්දීමක් රහිතව, බැංකුව වෙත පවතින වගකීම්, එම වගකීම් සත්‍ය, අභඹු, ප්‍රාථමික, හෝ සහායක, හවුල් හෝ වෙන් වෙන් වගකීම් වුවද ඒ සමග ගිණුමක්/ගිණුම් සම්බන්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ එවැනි ගිණුම් වල බැර වී පවතින මුදලක්/මුදල් ගිණුම් හිමියාට වෙනත් යම් ගිණුමක් මත හෝ වෙනත් යම් ආකාරයකින් බැංකුවෙන් ගෙවිය යුතුව පවතින වෙනත් යම් මුදලක්/මුදල් පියවා ගැනීම හෝ මාරු කිරීම සිදුකළ හැක.

11.10 බැංකුවට අදාළ වන නීතිරීති වලට අනුව ක්‍රියාකිරීම සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බාධක වලට ලක්වනු ඇති වෙනත් තැනැත්තන් හෝ ආයතන වෙත මූල්‍ය හා වෙනත් සේවාවන් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් පවතින විධිවිධාන වලට අනුකූලව බැංකුව ක්‍රියාකළ යුතු වේ. එබැවින්, බැංකුවේ තනි සහ පූර්ණ අභිමතය පරිදි එවැනි නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකිරීම සුදුසු යැයි සැලකීමට බැංකුවට හිමිකම පවතී. යම් ගෙවීම් පණිවුඩයක් සහ ගනුදෙනුකරු විසින් හෝ වෙතට හෝ ඔහු වෙනුවෙන් බැංකුවේ පද්ධති හරහා එවනු ලබන වෙනත් තොරතුරක් හෝ සන්නිවේදනයක් හසුකරගැනීම හා විමර්ශනය කිරීම ද; යම් නමක් තහනම් පුද්ගලයෙකුගේ හෝ ආයතනයකදැයි යන්න හෝ එයින් අදාළ පුද්ගලයා හෝ ආයතනය සත්‍ය වශයෙන් ම අදහස් වන්නේ දැයි වැඩිදුර විමසීම් සිදුකිරීම ද එවැනි ක්‍රියාවන්ට ඇතුළත් වනු ඇති නමුත් ඊට සීමා නොවේ. බැංකුව, යම් පාර්ශ්වයකට දරන්නට සිදුවන පහත කරුණු මගින් පැන නගින අලාභ (ඍජු හෝ ආනුෂංගික වශයෙන්, ලාභ හෝ පොළී අහිමිවීම් ද ඇතුළත් ව ඊට සීමා නොවී) හෝ හානි සම්බන්ධයෙන් වගකීමට ලක් නොවනු ඇතඃ

11.10.1 යම් පියවරක් මගින් මෙකී නීතිරීති හා කොන්දේසි යටතේ හෝ වෙනත් වගකීම් යටතේ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුව විසින් සිය තනි සහ පූර්ණ අභිමතය මත ක්‍රියාකිරීමට සුදුසු යැයි සලකන නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව සිය කාර්යයන් කිසිවක් ඉටුකිරීමේ දී බැංකුවෙහි යම් ප්‍රමාදයක් හෝ අසමත්වීමක්; හෝ

11.10.2 මෙම වගන්තිය යටතේ බැංකුවට පවතින යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමක්. සමහර අවස්ථාවන් හි දී, බැංකුව විසින් ගන්නා ක්‍රියාමාර්ගය මගින් ඇතැම් තොරතුරු සැකසීමේ දී ප්‍රමාදයක් වැළකීම හෝ ඇතිවීම සිදුවිය හැකිය. එබැවින්, මෙම වගන්තියට අනුකූලව කරන ලද යම් ක්‍රියාවක විෂයය වන ගෙවීම් පණිවුඩ හා සන්නිවේදනවලට අදාළ ව බැංකුවේ පද්ධතිවල පවතින යම් තොරතුරක් එම ක්‍රියාව සිදුකරමින් පවතින අතරතුර එයට ප්‍රවේශ වන අවස්ථාවේදී නිවරද්‍ය හෝ යාවත්කාලීන බවට බැංකුව තහවුරු නොකරයි. අදාළ යම් නීතිරීතිවල සහ රෙගුලාසිවල පවතින අබිබවනය කිරීමේ අවශ්‍යතාවලට යටත්ව, සාධාරණ වශයෙන් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම තත්ත්වයන්ගේ පැවතීම සම්බන්ධයෙන් බැංකුව විසින් ගනුදෙනුකරු/ ගනුදෙනුකරුවන් වෙත දැනුම්දීමට උත්සාහ දරනු ඇත.

11.11. ගනුදෙනුකරු හෝ ගනුදෙනුකරුගේ කොටස් හිමියෙකු (ඍජු හෝ වක්‍ර, නෛතික හෝ අර්ථලාභී වුවද) ධාරක කොටස් නිකුත් කිරීමට අවසර ඇති රටක සංස්ථාපනය කරන ලද සමාගමක් වන්නේ නම්, සමාගම හෝ එහි කොටස් හිමියා හෝ ධාරක කොටස් කිසිවක් නිකුත් කර නොමැති බවට ගනුදෙනුකරු තහවුරු කරන අතර, බැංකුව වෙත පූර්ව ලිඛිත දැනුම්දීමකින් තොරව බැංකුව විසින් හෝ කොටස් හිමියෙකු විසින් ධාරක කොටස් නිකුත් කිරීම හෝ තම කොටස් හෝ එකී කොටස් හිමියාගේ කොටස් (අදාළ පරිදි) ධාරක තත්ත්වයට පරිවර්තනය කිරීමක් නොකරන බවට ද වැඩිදුරටත් භාර ගනියි. බැංකුව සමග පවතින ගිණුම් සම්බන්ධතාව ඉන් අනතුරුව ධාරක කොටස් බවට පරිවර්තනය කිරීමට

පෙර පැවති ආකාරයට පැවතිය යුතුය. ඉහත කී පරිදි බැංකුව වෙත පූර්ව ලිඛිත දැනුම්දීමකින් තොරව ධාරක කොටස් නිකුත් කර ඇති අවස්ථාවක යම් ගිණුමක් වසා දැමීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

11.12. මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කලින් කලට බලාත්මකව පවතින නීතිරීති වලට අනුකූලව අර්ථනිරූපණය කළ යුතු වන අතර, මෙම නීතිරීති හා කොන්දේසි අතරින් කිසිවක් නීතිය මගින්, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කළ උපදෙස් මගින් සංශෝධනය කිරීමට අවශ්‍ය කෙරන්නේ නම් ස්වයංක්‍රීයව ම ඒවා සංශෝධනය වනු ඇත.

12. නීතිරීති හා කොන්දේසි

12.1 අදාළ නීතිරීති හා කොන්දේසි ප්‍රකාශන කොටසෙහි අන්තර්ගත කර තිබුණ ද ඒ බව නොසලකා මෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි මගින් ගිණුම් හිමියා/හිමියන් සම්පූර්ණයෙන් සහ සමාන ලෙස බැඳී සිටිනු ඇත.

12.2 මෙම නීතිරීති හා කොන්දේසි මෙරට බලාත්මකව පවතින නීතිරීති වලට අනුකූලව අර්ථනිරූපණය කළ යුතු වන අතර, මෙම නීතිරීති හා කොන්දේසි අතරින් කිසිවක් නීතිය මගින්, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කළ උපදෙස් මගින් සංශෝධනය කිරීමට අවශ්‍ය කෙරෙන්නේ නම්, ස්වයංක්‍රීයව ම ඒවා සංශෝධනය වනු ඇති අතර, එසේ නැතහොත් බැංකුව විසින් අවශ්‍යතාව පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

12.3 මෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි මගින් ගිණුම් හිමියා/හිමියන් සම්පූර්ණයෙන් සහ සමාන ලෙස බැඳී සිටිනු ඇත. කෙසේ වුවද, මෙම නීතිරීති හා කොන්දේසි වලට සිදුකරන යම් සංශෝධනයක් බැංකුවේ සියලුම ශාඛාවන් හි සහ සේවා මධ්‍යස්ථාන වල දැන්වීම් පුවරුවේ සහ වෙනත් පොදු ප්‍රදේශයන් හි මෙන්ම බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cargillsbank.com හි ප්‍රදර්ශනය සහ/හෝ ප්‍රකාශන පණිවුඩ මගින් දැනුම් දෙනු ඇති අතර, එය ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම්දීමක් ලෙස අර්ථනිරූපණය කළ යුතු වේ. සංශෝධිත නීතිරීති හා කොන්දේසි වල පිටපතක් ගිණුම් හිමියා/හිමියන්ට බැංකුවේ ශාඛා කාර්යාල වෙතින් ඉල්ලීමකින් ලබාගත හැකි වේ.

ගිණුමක් විවෘත කරන හෝ අඛණ්ඩව පවත්වාගෙන යන ඕනෑම තැනැත්තෙකු මෙම නීතිරීති හා කොන්දේසි හෝ අදාළ පරිදි වෙනත් යම් අදාළ නීතිරීති හා කොන්දේසි කියවා තේරුම්ගෙන සිටින බවට සැලකෙන අතර, ඒ මගින් බැඳී සිටිනු ඇත. ගිණුමක්/ගිණුම් විවෘත කිරීම සඳහා ඇති අයදුම්පතෙහි ඒ සම්බන්ධයෙන් ප්‍රකාශනයක් සම්පූර්ණ කළ යුතු වේ.

12.4 මෙම නීතිරීති හා කොන්දේසි සිංහල හා දමිළ භාෂා වලින් ලබාගත හැක. ඉංග්‍රීසි, සිංහල සහ දමිළ ලේඛන අතර කිසියම් පරස්පරතාවක් පැවතියහොත් ඉංග්‍රීසි පිටපත බලාත්මකව පවතිනු ඇත.

12.5 මෙම නීතිරීති හා කොන්දේසිවල දමිළ හා ඉංග්‍රීසි පරිවර්තන බැංකුවේ වෙබ් අඩවියෙන් (www.cargillsbank.com) ද, බැංකුවේ සියලුම කාර්යාල සහ/හෝ ශාඛා කාර්යාල වෙතින් මුද්‍රිත ආකෘතියෙන් ද ලබාගත හැකිය.

ඔබ වෙත සේවය සැලසූ ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සෑහීමකට පත් නොවන අවස්ථාවක දී, හෝ අපගේ සැලසුම් මගින් ඔබේ අපේක්ෂාවන් ඉටු නොවන අවස්ථාවක දී, පහත විකල්ප අතරින් එකක් හරහා කරුණාකර හැකි ඉක්මනින් අප හා සම්බන්ධ වන්න:

- පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් අංක + 94 117 640 000 ඔස්සේ අමතන්න.
- විද්‍යුත් තැපැල් customersupport@cargillsbank.com වෙත ඔබේ ගැටලුව යොමුකරන්න.
- අප වෙත ලියන්න: මෙහෙයුම් ප්‍රධානී, කාගිල්ස් බැන්ක් ලිමිටඩ්, අංක 696, ගාලු පාර, කොළඹ 03
- අප වෙත ඉදිරිපත් කරන ගැටලු ගිණුම් හිමියාගේ සම්පූර්ණ සතුටට හේතුවන පරිදි විසඳීමට අප සෑම විටම උත්සාහ කරන අතර, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත ලියා සහන ඉල්ලා සිටීමට ද ගිණුම් හිමියා/හිමියන් හට ඔබට හැකිය. ඔම්බුඩ්ස්මාන්වරයා හා සම්බන්ධවීමේ තොරතුරු පහත පරිදි වේ:
- මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය-ශ්‍රී ලංකාව, 143ඒ, වජිර පාර, කොළඹ 05
  දුරකථන: +94 112 595 624 ෆැක්ස්:+94 112 595 625
  විද්‍යුත් තැපෑල: info@financialombudsman.lk
  වෙබ් අඩවිය: www.financialombudsman.lk

  වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.cargillsbankc.com වෙත පිවිසෙන්න.

13. අවසන් කිරීමෙන් පසුව පැවැත්ම

13.1 මෙම නීතිරීති ඒවා අවසන් කිරීමෙන් පසුව ද, කාගිල්ස් බැංකුව විසින් ගනුදෙනුකරු වෙත යම් සේවාවන් සැපයීම අවසන් කිරීමකින් හෝ යම් පාරිභෝගික ගිණුමක් වසා දැමීමෙන් පසුව ද අඛණ්ඩව අදාළ වනු ඇත.

14. පාලනයෙන් බැහැර සිදුවීම්

පාලනයෙන් බැහැර සිදුවීමක් අවසන් වන තෙක් අප විසින් සේවාවන් සැපයීම අත්හිටුවීමට හැකිය.

"පාලනයෙන් බැහැර සිදුවීම්" යන්නෙන් පහත දෑ අදහස් වේ:

a) ගංවතුර, කුණාටු, භූමිකම්පා, හෝ වෙනත් ස්වභාවික සිදුවීමක්;

b) යුද්ධය, එදිරිවාදිකම්, ත්‍රස්තවාදය, විප්ලව, කැරළි, හෝ සිවිල් කෝලාහල;

c) වැඩවර්ජන, පිටලෑම් හෝ වෙනත් කම්කරු ක්‍රියාමාර්ග;

d) යම් නීතියක වෙනස්වීමක් හෝ අර්ථනිරූපණයේ හෝ යම් නීතියක බලාත්මක කිරීමෙහි යම් වෙනස්වීමක්;

e) යම් අධිකාරියක ක්‍රියාවක් හෝ නියෝගයක්;

f) කිසියම් අධිකරණයක හෝ වෙනත් අධිකරණ ආයතනයක නියෝගයක්;

g) යම් ව්‍යවහාර මුදල් වර්ගයක් ලබාගැනීමේ හැකියාව, පරිවර්තනය කිරීමේ හැකියාව, ණයවර හෝ මාරුකිරීමේ හැකියාවට සීමාකිරීම් හෝ බාධක පැනවීම;

h) පරිගණක පද්ධති අකර්මන්‍ය වීම හෝ බිඳවැටීම (ඊට හේතුව නොසලකා), හෝ පරිගණක පද්ධතියකට තෙවන පාර්ශ්වයක් විසින් මැදිහත් වීම;

i) තෙවන පාර්ශ්වයක් විසින් ඔබ වෙත හෝ අප වෙත සපයන ලද යම් භාණ්ඩයක හෝ සේවාවක වරදක්, බිඳ වැටීමක්, ප්‍රමාදයක් හෝ ලබාගැනීමට නොමැති වීමක; හෝ

j) සාධාරණ පරිදි අපගේ පාලනයෙන් බැහැර වෙනත් යම් තත්ත්වයන්.

15. බුන්වත්වීම් පිළිබඳ නීතිමය කටයුතු

යනුවෙන් අදහස් වන්නේ පහත දෑ වලට අදාළව සිදුවන වාණිජ නඩුවක්, නෛතික ක්‍රියාමාර්ගයක් හෝ වෙනත් පියවරකි:

(a) ගෙවීම් අත්හිටුවීම, ණයගැතිභාවය, වස්තුභංගත්වය, ඈවර කිරීම, විසුරුවා හැරීම, පරිපාලනය හා ප්‍රතිසංවිධානය (ද්‍රවශීල ඈවර කිරීමක් හෝ ප්‍රතිසංවිධානයක් හැර) හෝ ණය හිමියන් සමග සම්මුතියකට හෝ සැලසුමකට එළඹීම;

(b) ඔබ හෝ ඔබගේ වත්කම් සම්බන්ධයෙන් (ද්‍රවශීල ඈවර කිරීමකදී හැර) ඈවරකරුවෙකු, ලැබුම්කරුවෙකු, අද්මිනිස්ත්‍රාසිකරුවෙකු, හෝ ඊට සමාන නිලධාරියෙකු පත් කිරීම;

(c) ඔබගේ වත්කම් කිසිවකට බලපාන පවරාගැනීමක්, ඈඳාගැනීමක්, තහනමට ගැනීමක් හෝ ඇස්කීසි කිරීමක් හෝ ඔබගේ වත්කම් මත පවතින යම් සුරක්ෂිතයක් බලාත්මක කිරීමක්; හෝ

(d) ඕනෑම බලප්‍රදේශයක ඊට සමාන ක්‍රියාමාර්ගයක් හෝ පියවරක්.

අප විසින් ගිවිසුම අවසන් කිරීම - පහත කරුණු මත අප විසින් සේවාවන් සියල්ල හෝ කොටසක් හෝ ගිවිසුම පූර්ව දැනුම්දීමක් නොමැතිව අවසන් කළ හැකිය:

(a) ඔබ විසින් මෙම ගිවිසුමෙහි හෝ පාර්ශ්වකරුවන් අතර පවතින වෙනත් යම් ගිවිසුමක නීතිරීති කිසිවක් කඩකිරීම;

(b) ඔබ ඔබගේ ආදායම් හෝ වත්කම් සියල්ල හෝ ඉන් කොටසකට හෝ අදාළව **බුන්වත්භාවය සම්බන්ධ කිසියම් නීතිමය ක්‍රියාමාර්ගයකට** ලක්ව සිටීම;

(c) මෙම ගිවිසුම යටතේ පවතින බැඳීම් ඔබ විසින් හෝ අප විසින් ඉටුකිරීම නීති විරෝධී වීම හෝ එසේ වීමට හැකියාවක් පැවතීම;

(d) මෙම ගිවිසුමට අනුව ක්‍රියා කිරීම මගින් නියාමන අවශ්‍යතාවක් හෝ යම් අධිකාරියක අදාළ නියෝගයක් හෝ තහනමකට අදාළව අපගේ ප්‍රතිපත්ති කඩකිරීමකට ලක්වීම; හෝ

(e) අප විසින් සාධාරණ පරිදි සුවිශේෂී යැයි සලකනු ලබන ඔබට හෝ සේවාවට බලපාන යම් සිදුවීමක් සිදුවීම මත.

16. ක්‍රියාත්මක නොවන ගිණුම් - අක්‍රීය සහ අතහැර දැමූ දේපල

යම් ගිණුමක් ක්‍රියාත්මක නොවන තත්ත්වයට පත් වූ විට සහ අක්‍රීය තත්ත්වයට පත්වූ විට, ගනුදෙනුකරු විසින් එම ගිණුම සක්‍රීය කිරීමට සිදුකරන ඉල්ලීමක් ද සමග ඔවුන්ගේ වර්තමාන තොරතුරු (ආයතන තොරතුරු, ඇමතුම් තොරතුරු සහ මූල්‍ය තොරතුරු) සැපයිය යුතු වේ.

අතහැර දැමූ දේපල යන්නට, යම් බැංකු ගිණුමක (ජංගම, ඉතුරුම්, වාර තැන්පතු හෝ වෙනත්) පවතින ශේෂය සහ, බැංකු පහසුකමක් සම්බන්ධයෙන් ඇති සුරක්ෂිතයක් හැර (ආරක්ෂිත තැන්පතු ලොකරයක අන්තර්ගතය වැනි) ගනුදෙනුකරු විසින් හෝ වෙනුවෙන් බැංකුවෙහි තබා ඇති සහ වසර දහයකට වැඩි කාලයක් තිස්සේ ඒ සම්බන්ධයෙන් කිසිදු ගනුදෙනුවක් සිදුවී නොමැති වෙනත් දේපල ඇතුළත් වේ.

වාර්ෂික පදනමින් සෑම වර්ෂයකම අවසානයේ සිට මාස හයක කාලයක් තුළ එවැනි අතහැර දැමූ දේපල සම්බන්ධයෙන් බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත එහි මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකෘතියකින් වාර්තාවක් සැපයිය යුතු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත වාර්තාව සැපයීමෙන් දින තිහ (30)ක් තුළ බැංකුව විසින් එවැනි අතහැර දැමූ දේපල වල සම්පූර්ණ ලැයිස්තුවක් හිමිකරුගේ නම සහ දේපලට අදාළ තොරතුරු සඳහන් කරමින් සිංහල, ඉංග්‍රීසි සහ දමිළ භාෂා වලින් පුවත්පත් වල පළකරනු ඇත

ඊට සමගාමීව, අතහැර දැමූ දේපල පිළිබඳව දන්වමින් බැංකුව විසින් ලියාපදිංචි තැපෑලෙන් අතහැර දැමූ දේපල වල අදාළ හිමිකරුවන්ට දේපල ඉල්ලා සිටීමට සාධාරණ කාලසීමාවක් ලබාදෙමින් ඔවුන්ගේ අවසානයට දන්නා ලිපිනයට දැන්වීම් යවනු ඇත.

ගනුදෙනුකරු විසින් වලංගු ඉල්ලීමක් ඉදිරිපත් නොකළහොත්, බැංකුව විසින් සාධාරණ පරිදි තීරණය කරනු ලබන කාලයක් තුළ,

a) සියලුම මුදල් වර්ග වලින් ඇති අක්‍රීය ගිණුම් වල පවතින මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත මාරු කරනු ඇත.
b) ආරක්ෂිත තැන්පතු ලොකර් කඩා විවෘත කර එහි අන්තර්ගතය පිටතට ගනු ඇත.

අනන්‍යතාව ඔප්පු කිරීමෙන් පසුව එසේ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත මාරු කරන ලද මුදල් ඉල්ලා සිටීමට ගනුදෙනුකරුවන්ට හිමිකම පවතී.

ආරක්ෂිත තැන්පතු ලොකර වල (SDL) අන්තර්ගතය, වලංගු ඉල්ලීමක් ඉදිරිපත් කරන තෙක් විනාශ නොකර බැංකුවේ භාරයේ සුරක්ෂිතව තබාගනු ඇත.

අතහැර දැමූ දේපල ඉල්ලා සිටින ගනුදෙනුකරුගේ උරුමකරුවන් සහ අනුප්‍රාප්තිකයන් විසින් නීතියෙන් නියම කර ඇති ආකාරයට ඔවුන්ගේ ඉල්ලීම් තහවුරු කිරීම සඳහා ලේඛන බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ඉහත කී කාර්යපටිපාටිය සඳහා බැංකුව විසින් දරන පිරිවැය බැංකුව විසින් අතහැර දැමූ දේපල වල හිමිකරුවන් වෙතින් අයකර ගැනෙනු ඇත.